| 6 | අ. පො. ස. (සාමාන්‍ය පෙළ) - ගණිතය<br>පසුගිය විභාග ප්‍රශ්න<br>**වර්ගජ සමීකරණ** | තේමාව<br>**වීජ ගණිතය** |
|---|---|---|

**1.** අරය ඒකක $x$ වූ $A$ නම් අර්ධ වෘත්තයකින් ද අර්ධ වෘත්තය සමග ඒකකේන්ද්‍රිය වූ සහ කේන්ද්‍රයේ කෝණය $60^\circ$ වූ $B$ නම් කේන්ද්‍රික ඛණ්ඩයකින් ද සැදුණු ආස්තරයක් රූපයේ දැක්වේ. $A$ හි වර්ගඵලය සහ $B$ හි වර්ගඵලය සමාන වේ නම්, $x$ මගින් $x^2 - 4x - 8 = 0$ වර්ගජ සමීකරණය තෘප්ත කරන බව පෙන්වා $x$ ට ගත හැක්කේ එකම එක අගයක් පමණක් බව හේතු සහිතව පෙන්වන්න.




$\sqrt{3}$ හි අගය සඳහා 1.73 යොදා ගෙන $B$ කේන්ද්‍රික ඛණ්ඩයේ අරය සඳහා ආසන්න අගයක් පළමු දශමස්ථානයට සොයන්න. (O/L 2019)

G.Jayasundara - S.T.C.

---

**2.** සෘජුකෝණාස්‍රයක බද්ධ පාද දෙකක දිගෙහි එකතුව 16 cm ද විකර්ණයක දිග 14 cm ද වේ. සෘජුකෝණාස්‍රයේ පළල $x$ cm ලෙස ගත් විට $x^2 - 16x + 30 = 0$ වර්ගජ සමීකරණය තෘප්ත කරන බව පෙන්වා, සෘජුකෝණාස්‍රයේ දිග හා පළල පළමුවන දශමස්ථානයට වෙන වෙනම සොයන්න.

($\sqrt{34}$ හි අගය සඳහා 5.83 යොදාගන්න.) (O/L 2018)

---

**3.** පහත දැක්වෙන තල රූප දෙක පිළිවෙළින් අරය ඒකක $x$ වූ වෘත්තයකින් අර්ධයක් හා අරය ඒකක $(x+2)$ වූ වෘත්තයකින් හතරෙන් පංගුවක් වේ.




තල රූප දෙකෙහි වර්ගඵල සමාන නම්, $x$ ඇසුරෙන් වර්ගජ සමීකරණයක් ගොඩනගා එය විසඳීමෙන් $x$ හි අගය පළමු දශමස්ථානයට නිවැරදි ව සොයන්න. $\sqrt{2}$ හි අගය සඳහා 1.41 යොදා ගන්න.

(අරය $r$ වන වෘත්තයක වර්ගඵලය $\pi r^2$ වේ.) (O/L 2017 – new)

---

**4.** දිග මීටර 4ක් හා පළල මීටර 2ක් වන සෘජුකෝණාස්‍රාකාර තහඩුවක්, රූපයේ දැක්වෙන පරිදි සෘජු කඩ ඉරි රේඛා දෙකක් ඔස්සේ කැපූ විට ලැබෙන $P$ කොටස සමචතුරස්‍රාකාර වේ.

$P$ කොටසේ පැත්තක දිග මීටර $x$ ලෙස ගනිමු.




(i) රූපයේ $Q$ ලෙස දැක්වෙන සෘජුකෝණාස්‍රාකාර කොටසේ වර්ගඵලය සඳහා ප්‍රකාශනයක්, $x$ ඇසුරෙන් සොයන්න.

$P$ හි වර්ගඵලය $Q$ හි වර්ගඵලය මෙන් දෙගුණයකි.

(ii) $x^2 - 12x + 16 = 0$ බව පෙන්වන්න.

(iii) සූත්‍රය භාවිතයෙන් හෝ අන් ක්‍රමයකින් හෝ $x = 6 \pm 2\sqrt{5}$ බව පෙන්වන්න.

(iv) $6 + 2\sqrt{5}$ අගය $x$ සඳහා සුදුසු **නො වන** බව පෙන්වන්න.

(v) $\sqrt{5}$ හි අගය 2.24 ලෙස ගෙන $x$ සඳහා සුදුසු අගය සොයන්න. (O/L 2016 – new)

**5.** රූපයේ දැක්වෙන $ABCD$ සෘජුකෝණාස්‍රයේ $AB = 3x + 2\ cm$ ද $AD = x + 3\ cm$ ද වේ. $APQD$ සමචතුරස්‍රයක් බව දී ඇත.




(i) $PB = 2x - 1\ cm$ බව පෙන්වන්න.

(ii) $\frac{AB}{AD} = \frac{PQ}{PB}$ බව දී ඇත. $5x^2 - 5x - 11 = 0$ බව පෙන්වන්න.

(iii) සූත්‍රය භාවිතයෙන් හෝ අන් ක්‍රමයකින් හෝ $x = \frac{5 \pm 7\sqrt{5}}{10}$ බව පෙන්වන්න.

(iv) ඉහත (i) කොටසෙහි $PB$ හි දිග සඳහා වන ප්‍රකාශනයෙහි $x = \frac{5 - 7\sqrt{5}}{10}$ විසඳුම ආදේශයෙන්, මෙම විසඳුම සුදුසු නොවන බව පෙන්වන්න. (O/L 2015)

---

**4.** $ABCD$ සෘජුකෝණාස්‍රාකාර වීදුරු තහඩුවෙන් $ADE$ සමද්විපාද ත්‍රිකෝණාකාර කොටස කපා ඉවත් කරනු ලැබේ (රූපය බලන්න). $CE$ හි දිග 1m වේ.

G.Jayasundara - S.T.C.




(i) $DE$ හි දිග මීටර $x$ ලෙස ගෙන, තහඩුවෙහි ඉතිරි වන කොටසේ වර්ගඵලය සඳහා ප්‍රකාශනයක් $x$ ඇසුරෙන් ලියන්න.

ඉතිරි වන $ABCE$ කොටසෙහි වර්ගඵලය $5\ m^2$ වේ.

(ii) $x^2 + 2x - 10 = 0$ බවත් මෙම සමීකරණයේ විසඳුම $-1 \pm \sqrt{11}$ බවත් පෙන්වන්න.

(iii) $DE$ හි දිග සඳහා සුදුසු විසඳුම තෝරාගෙන, $AD$ හා $DC$ දිග එක එකක් $\sqrt{11}$ ඇසුරෙන් ලියා දක්වන්න.

(iv) $ABCD$ තහඩුවෙහි වර්ගඵලය වර්ගමීටර $11 - \sqrt{11}$ බව පෙන්වා, $\sqrt{11}$ හි අගය 3.317 ලෙස ගෙන මෙම වර්ගඵලය වර්ගමීටරවලින් දශමස්ථාන දෙකකට සොයන්න. (O/L 2014)

---

**5.** රූපයේ දැක්වෙන පරිදි, $ABCD$ සෘජුකෝණාස්‍රාකාර ලෝහ තහඩුවකින් $PBCQ$ සෘජුකෝණාස්‍රාකාර කොටස කපා ඉවත් කරන ලදී. $PB$ හි දිග 10 cm වේ. ඉතිරි වන $APQD$ කොටස සමචතුරස්‍රයකි. එම සමචතුරස්‍රාකාර කොටසෙහි වර්ගඵලය, කපා ඉවත් කළ කොටසෙහි වර්ගඵලයට වඩා $2\ cm^2$ කින් වැඩි ය.




(i) $AD = x$ cm ලෙස ගෙන, කපා ඉවත් කළ කොටසේ වර්ගඵලය සඳහා ප්‍රකාශනයක්, දී ඇති තොරතුරු භාවිතයෙන්, $x$ ඇසුරෙන් ලියා දක්වන්න.

(ii) $x$ මගින් $x^2 - 10x - 2 = 0$ සමීකරණය සපුරාලනු ලබන බව පෙන්වන්න.

(iii) ඉහත (ii) හි ඇති සමීකරණය වර්ගපූරණ ක්‍රමයෙන් හෝ අන් ක්‍රමයකින් හෝ විසඳා, $\sqrt{3} = 1.73$ ලෙස ගෙන සමචතුරස්‍රාකාර කොටසේ පැත්තක දිග සෙන්ටිමීටරවලින් සොයන්න. (O/L 2013)

---

**6.** 16 cm දිග කම්බියක් නැවීමෙන් සෘජුකෝණාස්‍රාකාර රාමුවක් සකස්කර ඇත.

(i) රාමුවේ දිග $x$ ලෙස ගෙන එහි පළල $x$ ඇසුරෙන් ලියන්න.

(ii) එම රාමුවෙන් වට වී ඇති වර්ගඵලය $11\ cm^2$ වේ නම්, $x$ මගින් $x^2 - 8x + 11 = 0$ වර්ගජ සමීකරණය සපුරාලන බව පෙන්වන්න.

(iii) වර්ග පූරණයෙන් හෝ අන් ක්‍රමයකින් හෝ ඉහත සමීකරණය විසඳා කම්බි රාමුවේ දිග ගණනය කරන්න. ( $\sqrt{5} = 2.24$ ලෙස ගන්න.) (O/L 2012)